# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 244/4 — 1976 දෙසැම්බර් 20 වැනි සඳුද — 1976.12.20

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### මුද්දර ආඥාපනත

(247 වැනි අධිකාරය වන) මුද්දර ආඥාපනතේ 6 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද රීතිය.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
මුදල් අමාත්‍ය.

1976 දෙසැම්බර් මස 17 දින,
කොළඹ දීය.

රීතිය

(247 වැනි අධිකාරය වන) මුද්දර ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ සාදනු ලැබ, 1966 අගෝස්තු මස 5 වැනි දින අංක 14,707 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලදුව, 1976 නොවැම්බර් මස 26 දින අංක 240/12 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රීතියෙන් අන්තිම වරට සංශෝධිත රීතියෙහි උපලේඛනයේ 145 වැනි විෂයයට ඉක්බිතිවම පහත සඳහන් අළුත් විෂයයන් ඇතුළත් කිරීමෙන් එම රීතිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ. :

146. ඇලෙක්සැන්ඩර් ග්‍රෙහැම් බෙල් ගේ සිතුවමක් සහ ඔහු විසින් නිපදවන ලද ප්‍රථම ටැලිෆෝනය පිළිබිඹු කෙරෙන රු. 1 ක් වටිනා තැපැල් හා ආදායම් (සමරු) මුද්දරය.

147. තාරා දෙව්ලුවගේ මූර්තිය පිළිබිඹු කෙරෙන රු. 5 ක් වටිනා තැපැල් සහ ආදායම් (සමරු) මුද්දරය.

148. සුන්දර මූර්ති ස්වාමිගේ මූර්තිය පිළිබිඹු කෙරෙන රු. 1 ක් වටිනා තැපැල් සහ ආදායම් (සමරු) මුද්දරය.

149. මෛත්‍රිය බෝධිසත්වයන්ගේ මූර්තිය පිළිබිඹු කෙරෙන ශත 50 ක් වටිනා තැපැල් සහ ආදායම් (සමරු) මුද්දරය.

150. මහනුවර රාජධානියේ රජවරුන්ගේ සිංහාසනය පිළිබිඹු කෙරෙන රු. 2 ක් වටිනා තැපැල් සහ ආදායම් (විශේෂ) මුද්දරය.

151. මහනුවර රාජධානියේ රජවරුන් පැළඳි ඔටුන්න පිළිබිඹු කෙරෙන රු. 1 ක් වටිනා තැපැල් සහ ආදායම් (විශේෂ) මුද්දරය.

12-706/1

---

### තැපැල් කාර්යාල ආඥාපනත

(190 වැනි අධිකාරය වන) තැපැල් කාර්යාල ආඥාපනතේ 16 වැනි වගන්තිය යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යවරයා විසින් සාදන ලද රීතිය.

සී. කුමාරසූරියර්,
තැපැල් සහ විදුලි සංදේශ අමාත්‍ය.

1976 දෙසැම්බර් මස 20 දින,
කොළඹ දීය.

### රීතිය

(190 වැනි අධිකාරය වන) තැපැල් කාර්යාල ආඥාපනතේ 16 වැනි වගන්තිය යටතේ සාදනු ලැබ, 1966 අගෝස්තු මස 5 වැනි දින අංක 14,707 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලදුව, 1976 නොවැම්බර් මස 26 වැනි දින අංක 240/12 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රීතියෙන් අන්තිම වරට සංශෝධිත රීතියෙහි උපලේඛනයෙහි 146 වැනි විෂයයට ඉක්බිතිවම පහත සඳහන් අළුත් විෂයයන් ඇතුළත් කිරීමෙන් එම රීතිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ. :

147. ඇලෙක්සැන්ඩර් ග්‍රෙහැම් බෙල් ගේ සිතුවමක් සහ ඔහු විසින් නිපදවන ලද ප්‍රථම ටැලිපෝනය පිළිබිඹු කෙරෙන රු. 1 ක් වටිනා තැපැල් හා ආදායම් (සමරු) මුද්දරය.

148. තාරා දෙව්දුවගේ මූර්තිය පිළිබිඹු කෙරෙන රු. 5 ක් වටිනා තැපැල් සහ ආදායම් (සමරු) මුද්දරය.

149. සුන්දර මූර්ති ස්වාමීගේ මූර්තිය පිළිබිඹු කෙරෙන රු. 1 ක් වටිනා තැපැල් සහ ආදායම් (සමරු) මුද්දරය.

150. මෛත්‍රිය බෝධිසත්වයන්ගේ මූර්තිය පිළිබිඹු කෙරෙන ශත 50 ක් වටිනා තැපැල් සහ ආදායම් (සමරු) මුද්දරය

151. **මහනුවර රාජධානියේ රජවරුන්ගේ සිංහාසනය පිළිබිඹු කෙරෙන රු. 2 ක් වටිනා තැපැල් සහ ආදායම් (විශේෂ) මුද්දරය.**

152. **මහනුවර රාජධානියේ රජවරුන් පැළඳි ඔටුන්න පිළිබිඹු කෙරෙන රු. 1 ක් වටිනා තැපැල් සහ ආදායම් (විශේෂ) මුද්දරය.**

12-706/2

---

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### ටැලිපෝන් ශත සංවත්සරය නිමිත්තෙන් සමරු මුද්දරයක් නිකුත් කිරීම

ටැලිපෝන් ශත සංවත්සරය සැමරීම සඳහා රු. 1 වටිනාකමින් යුත් තැපැල් හා ආදායම් මුද්දරයක් 1976 දෙසැම්බර් 21 වන දින සිට විකිණීම සඳහා නිකුත් කරන බව මහජනයාගේ දැන ගැනීම පිණිස මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම මුද්දර තොග අවසන්වන තුරු විකිණෙනු ඇත. දැනට අලෙවියෙහි පවත්නා සමාන වටිනාකම් වලින් යුත්, එනම් රු. 1 මුද්දර ද නව මුද්දර සමග අඛණ්ඩව අලෙවි කරනු ලැබේ.

2. 1976 දෙසැම්බර් 21 වන දින නිකුත් කරනු ලබන රු. 1 මුද්දරය ඇලෙක්සැන්ඩර් ග්‍රෙහැම් බෙල් ගේ සහ ඔහු විසින් නිපදවන ලද ප්‍රථම ටැලිපෝනයේ චිත්‍රයක් පිළිබිඹු කරයි.

එම්. බී. ජේ. සිල්වා,
වැඩ බලන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව,
කොළඹ 1,
1976 දෙසැම්බර් මස 15 දින.

12-707

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී